**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2014**

---

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රේගුවට හිමිකමක් නොමැති ස්ථානයක ශිලා ලේඛනයක් ආරක්ෂා කිරීම සඳහා ආවරණයක් ඉදිකිරීම වෙනුවෙන් 2012 වර්ෂයේ දී රු.2,526,551 ක් වැයකර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ට පටහැනිව ඉහත මුදල ප්‍රාග්ධනිත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම 2014 දෙසැම්බර් 31 දිනට අදාල වත්කම සඳහා වූ සමුච්චිත ක්ෂය වටිනාකම රු.505,310 ක් විය.

(ආ) ත්‍යාග ගොනු 3 කට අදාලව එකතුව රු.54,500 ක ආදායමක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

ස්ථාවර වත්කම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.9,859,948 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වටිනාකම රු.11,234,859 ක් වූයෙන් රු.1,374,911 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

අරමුදලේ ලැබීම් හා ගෙවීම්වලට අදාලව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් හා දෙපාර්තමේන්තු පොත් අතර පිළිවෙලින් රු.399,717 ක් හා රු.1,142,665 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රේගු ආඥා පනතේ 153 (අ)(I) වගන්තිය | අරමුදලෙහි මුදල් වැය කළ හැකි අරමුණුවලට පටහැනිව අවස්ථා 5 කදී එකතුව රු.10,451,641 ක් වූ ගෙවීම් සිදුකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2002 ජනවාරි 13 දිනැති අංක DMA/07 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ සහ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි පරිගණක හා මෘදුකාංග පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය සහ 2006 ජූලි 30 දිනැති අංක 422 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මුදල් වර්ෂය තුලදී භාණ්ඩ මිලදී ගැනීම් සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු ලේඛනගත කර එම වාර්තාව මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

ශ්‍රී ලංකා රේගුවේ මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.24,071,854 ක මුදලක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් දරා තිබුණි. තවද එම මුදලින් රු.10,775,608 ක් වැය කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.393,796,271 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.478,770,293 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.84,974,022 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම් රු.76,663,765 කින් හෙවත් සියයට 12 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම/අඩුවීම**

ඉකුත් වර්ෂයේ රු. 24,633,534 ක් වූ පුහුණු කිරීම් හැර අනෙකුත් වියදම් සමාලෝචිත වර්ෂයේදී රු.49,646,587 ක් දක්වා සියයට 102 කින් වැඩි වී තිබුණ අතර රු.26,106,538 ක් වූ පශ්චාත් උපාධි පාඨමාලා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.2,783,800 ක දක්වා සියයට 89 කින් අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය.**

**4.1 කාර්යසාධනය**

ඉදිරිපත් කළ තොරතුරු අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම්/ වියදම් වර්ගය | 2014 වර්ෂයේ ආදායම/ වියදම | 2014 වර්ෂයේ මුළු ආදායමේ / මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස | 2013 වර්ෂයේ ආදායම/වියදම | 2014 වර්ෂයේ වැඩිවීම/ අඩුවීම 2013 වසරට සාපේක්ෂව - වටිනාකම | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | (රු.) (000) | | (රු.) (000) | (රු.) (000) | |
| **ආදායම** | | | | | |
| අල්ලාගත් භාණ්ඩ විකුණුම් | 89,824 | 17.40 | 109,869 | (20,045) | (18.24) |
| දණ්ඩන | 426,399 | 82.60 | 479,999 | (53,600) | (11.17) |
| වෙනත් ලැබීම් | 0 | 0 | 3,019 | (3,019) | (100) |
| මුළු ආදායම | 516,223 | 100 | 592,887 | (76,664) | (12.93) |
| **වියදම්** | | | | | |
| දේශීය පුහුණු | 15,911 | 12.99 | 12,063 | 3,848 | 31.89 |
| විදේශීය පුහුණු | 54,086 | 44.19 | 51,314 | 2,772 | 5.40 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 2,784 | 2.27 | 26,107 | (23,323) | (89.34) |
| අනෙකුත් වියදම් | 49,646 | 40.55 | 24,633 | 25,013 | 101.54 |
| මුළු වියදම් | 122,427 | 100 | 114,117 | 8,310 | 7.28 |
| අතිරික්තය | 393,796 | | 478,770 | (84,974) | (17.75) |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු පරීක්ෂණ මගින් අනාවරණය කර ගන්නා වැරදි සඳහා පනවන ලද දණ්ඩන හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායමින් සියයට 50 ක් ත්‍යාග සඳහා වෙන් කිරීමෙන් පසු ඉතිරි සියයට 50 ක මුදලින් සියයට 40 ක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කෙරේ. අරමුදලේ ආදායම සඳහා සමාලෝචිත වර්ෂයේදී දණ්ඩන හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් පිළිවෙලින් සියයට 82.6 ක් හා සියයට 17.4 ක දායකත්වයක් ලැබී තිබුණි.

(ආ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතාවය වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්වලට නිලධාරීන් යොමු කිරීමත්, අනතුරට ලක්වන නිලධාරීන්ට වන්දි ගෙවීමත් මෙම අරමුදලේ ප්‍රධාන අරමුණ විය. එම අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත නිර්ණායකයන් හඳුනා ගැනීමකින් තොරව අරමුදලට මුදල් වෙන්කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව වර්ධනය වෙමින් පැවතුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,889 ක් වූ සමුච්චිත ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,283 ක් දක්වා රු.මිලියන 394 කින් හෙවත් සියයට 10.13 කින් වර්ධනය වී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විදේශ අධ්‍යයන හා පුහුණු කටයුතු සඳහා විධිමත් පරිදි නිලධාරීන් තෝරා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා රේගුවේ පරිවාස කාලයේ සිටි නිලධාරීන් දෙදෙනෙකු විදේශ අධ්‍යාපන හා පුහුණු කටයුතු සඳහා යොමු කර තිබුණු අතර එක් නිලධාරියෙකු අවස්ථා 08 කදී විදේශ පුහුණු වැඩසටහන් සඳහා යොමු කර තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

අත්අඩංගුවට ගත් හා රාජසන්තක කළ බඩු ද්‍රව්‍ය සම්බන්ධයෙන් පැන නැගී තිබූ නඩු කටයුතු දෙකකට වැය කළ රු.1,272,300 ක්, ඒ සඳහා වූ අත්තිකාරම් ගිණුමෙන් දැරීම වෙනුවට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් දරා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල තථ්‍ය ආදායම් හා වියදම්, අයවැයගත ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 28 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ලේඛනයක් පිළියෙල කර ගිණුම් වර්ෂය ආරම්භවීමට මාස 3½ කට පෙර අදාල අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත් අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබුණේ ගිණුම් වර්ෂය ආරම්භ වී මාස 06 කට පසුය.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) අරමුදල් උපයෝජනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) මූල්‍ය පාලනය